# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2354/06 - 2023 ඔක්තෝබර් මස 16 වැනි සඳුදා - 2023.10.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු ජනාධිපති**
**රනිල් වික්‍රමසිංහ මැතිතුමන් විසිනි**

මුද්‍රාව

රනිල් වික්‍රමසිංහ

1. විශ්‍රාමික අගවිනිසුරු ජනාධිපති නීතිඥ ගරු වැවගේ ප්‍රියසත් ජෙරාර්ඩ් ඩෙප් මැතිතුමා
2. සුන්දරම් අරුමෙනායගම් මැතිතුමා
3. සේනානායක අලිසැන්ඩ්‍රලාගේ මැතිතුමා
4. ජනාධිපති නීතිඥ නලින් ජයන්ත අබේසේකර මැතිතුමා
5. රජිත නවීන් ක්‍රිස්ටෝපර් සේනාරත්න පෙරේරා මැතිතුමා
6. අහමඩ් ලෙබ්බෙ මොහොමඩ් සලීම් මැතිතුමා
7. සාගරිකා දෙල්ගොඩ මැතිතුමිය
8. එස්තර් ශ්‍රියාණි නිමල්කා ප්‍රනාන්දු මැතිතුමිය
9. විතාරණගේ දීපානි සමන්ත රොඩ්රිගෝ මැතිතුමා

වෙත,

ශුභාශිංසන පූර්වකවයි!

1978 වර්ෂයේදී ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්මත කිරීමත් සමඟ මෙරට මැතිවරණ ක්‍රමයේ සහ මැතිවරණ පවත්වන ආකාරයේ වෙනස්කම් සිදුකරමින් නව නීති හඳුන්වාදුන් අතර, යහපාලන මූලධර්මවලට අනුගත වෙමින් සහ නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කරමින් කාලීන සමාජ අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි එකී මැතිවරණ නීති තවදුරටත් සංශෝධනය වීමේ අවශ්‍යතාවයක් පැන නැගී ඇති හෙයින් ද;

තවද, දේශපාලන පක්ෂ, ස්වාධීන කණ්ඩායම් හා ඔවුන්ගේ සාමාජිකත්වය විසින් ඇතැම් අවස්ථාවලදී සිය දේශපාලන හා පොදු කටයුතු වලදී හැසිරෙන ආකාරය හා මාධ්‍ය භාවිතය යහපත් අයුරින් සිදු නොකිරීමේ ප්‍රවණතාවයක් දක්නට ලැබෙන බැවින් ඔවුන් සඳහා චර්යාධර්ම පද්ධතියක් හඳුන්වාදීමත්, මාධ්‍ය භාවිතය පිළිබඳව උපමාන සකස්කිරීමත් අවශ්‍යව ඇති හෙයින් ද;

තවද, සැබෑ අවශ්‍යතාවයකින් තොරව දේශපාලන පක්ෂ ලියාපදිංචිකර ඒවා මූල්‍යමය සහ වෙනත් අනිසි අරමුණු උදෙසා වෙනත් පාර්ශවයන් වෙත පැවරීම මෙන්ම, දේශපාලන පක්ෂවල ඇතැම් ක්‍රියාකලාපයන් හේතුවෙන් එකී පක්ෂ පිළිබඳ මහජනතාවගේ විශ්වාසනීයත්වය බිඳවැටී ඇති හෙයින්, විශ්වාසනීයත්වය සහ වගවීම ඇතිකරලීමෙහිලා දේශපාලන පක්ෂ ලියාපදිංචි කිරීම හා ඒවායෙහි ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වන නීතිමය රාමුව ශක්තිමත් කළ යුතුව ඇති හෙයින් ද;

තවද, මෙහි මින්මතු දැක්වෙන කරුණු පිළිබඳව විමර්ශනය කිරීම, පරීක්ෂා කිරීම හා වාර්තා කිරීම සම්බන්ධයෙන් පරීක්ෂණ කොමිෂන් සභාවක් පත් කිරීම අවශ්‍ය යැයි මා අදහස් කරනු ලබන හෙයින්;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති රනිල් වික්‍රමසිංහ වන මම, ඔබතුමන්ලාගේ විචක්ෂණභාවය, සාමාර්ථ්‍ය සහ විශ්වාසවන්තභාවය කෙරෙහි මහත් වූ භක්තියෙන් හා විශ්වාසයතබමින්, සංශෝධිත (393 වන අධිකාරය වන) 1948 අංක 17 දරන පරීක්ෂණ කොමිෂන් සභා පනතෙහි 2 වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව ඉහත කී,

1. විශ්‍රාමික අගවිනිසුරු ජනාධිපති නීතිඥ ගරු වැවගේ ප්‍රියසත් ජෙරාර්ඩ් ඩෙප් මැතිතුමා
2. සුන්දරම් අරුමෙනායගම් මැතිතුමා
3. සේනානායක අලිසැන්ඩ්‍රලාගේ මැතිතුමා
4. ජනාධිපති නීතිඥ නලින් ජයන්ත අබේසේකර මැතිතුමා
5. රජිත නවීන් ක්‍රිස්ටෝපර් සේනාරත්න පෙරේරා මැතිතුමා
6. අහමඩ් ලෙබ්බෙ මොහොමඩ් සලීම් මැතිතුමා
7. සාගරිකා දෙල්ගොඩ මැතිතුමිය
8. එස්තර් ශ්‍රියාණි නිමල්කා ප්‍රනාන්දු මැතිතුමිය
9. විතාරණගේ දීපානි සමන්ත රොඩ්රිගෝ මැතිතුමා

වන ඔබතුමන්ලා මතු දැක්වෙන කරුණු පිළිබඳව තොරතුරු ලබා ගැනීම, විමර්ශනය සහ පරීක්ෂාකර වාර්තා කිරීම සම්බන්ධයෙන් මාගේ කොමසාරිස්වරුන් ලෙස මෙයින් පත්කරමි.

එකී කරුණු කවරේද යත්;

01. පවත්නා සියලුම මැතිවරණ නීති රීති පිළිබඳව පරීක්ෂා කර බලා පහත සඳහන් කරුණුවලට ද විශේෂ අවධානයක් යොමුකරමින් කාලීන අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි මැතිවරණ නීති සංශෝධනය කිරීමට අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම :

   i. කාන්තා හා තරුණ නියෝජනය වැඩිකිරීම.

   ii. මැතිවරණයක් ප්‍රකාශයට පත්කළ දින සිට එකී මැතිවරණය පවත්වා ප්‍රතිඵල නිකුත් කරනු ලබන දින දක්වා වන කාලය අඩුකිරීම.

   iii. ඡන්දය භාවිතා කිරීමේදී මුද්‍රිත ඡන්ද පත්‍රිකාවක් භාවිතා කිරීම වෙනුවට නවීන තාක්ෂණය යොදා ගනිමින් ඉලෙක්ට්‍රොනිකව ඡන්දය භාවිතා කිරීම සඳහා අවස්ථාව සැලසීම.

   iv. විදේශගත ශ්‍රී ලාංකිකයින්ට ඡන්දය භාවිතා කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය.

   v. එකම පුද්ගලයෙකුට මහජන නියෝජිතයින් තෝරා ගැනීමේ මැතිවරණ 02කට තරග කිරීමටත්, සහ තේරී පත්වුවහොත් එකවර අදාල සභා දෙකම නියෝජනය කිරීමට අවස්ථාව ලබාදීම (*උදා:* පාර්ලිමේන්තුවට තේරී පත්ව ඇති පුද්ගලයෙකුට පළාත් සභා මැතිවරණයට තරග කිරීමට අවස්ථාව ලබා දී එයටද තේරී පත්වුවහොත් එකවර සභා දෙකම නියෝජනය කිරීමට අවස්ථාව ලබා දීම).

   vi. මැතිවරණ දිනයේදී මැතිවරණ කටයුතු වෙනුවෙන් සේවාවන් සපයනු ලබන රාජ්‍ය අංශයේ සේවය කරනු නොලබන ඡන්ද දායකයින්ටද තැපැල් ඡන්දය භාවිතා කිරීම සඳහා අවස්ථාව ලබාදීම.

vii. මහජන නියෝජිතයින් තෝරා ගැනීම සඳහා සමානුපාතික නියෝජන ක්‍රමයට පමණක් සීමා නොවී සමාජයේ බහුත්ව ස්වරූපය සැලකිල්ලට ගෙන එම බහුත්ව ලක්ෂණද නියෝජනය වන පරිදි කේවල ක්‍රමයද සමග සම්මිශ්‍රණය වූ සුදුසු ක්‍රමවේදයක් සකස්කිරීම.

02. දේශපාලන පක්ෂ, ස්වාධීන කණ්ඩායම් විසින් නිසි පරිදි මාධ්‍ය භාවිතා කළ යුතු ආකාරය පිළිබඳව මාධ්‍ය උපමාන සකස්කිරීම පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කිරීම.

03. දේශපාලන පක්ෂ, ස්වාධීන කණ්ඩායම් හා ඔවුන්ගේ සාමාජිකත්වය දේශපාලන හා පොදු කටයුතු ඉටුකිරීමේදී හැසිරිය යුතු ආකාරය සම්බන්ධව චර්යාධර්ම පද්ධතියක් හඳුන්වාදීම පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කිරීම.

04. දේශපාලන පක්ෂ ලියාපදිංචි කිරීම සහ විශ්වාසනීයව හා මහජනතාවට වගකියන අයුරින් ඒවායෙහි කටයුතු කිරීම සම්බන්ධව නීති රීති ශක්තිමත් කිරීම පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කිරීම.

තවද, පූර්වෝක්ත කොමිෂන් සභාවේ සභාපතිවරයා වශයෙන් විශ්‍රාමික අගවිනිසුරු, ජනාධිපති නීතිඥ ගරු වැවගේ ප්‍රියසත් ජෙරාර්ඩ් ඩෙප් මැතිතුමා වන ඔබ මම මෙයින් පත්කරමි.

තවද, පූර්වෝක්ත කරුණු පිළිබඳ ව ඔබහට පෙනී යන පරිදි අවශ්‍ය විය හැකි පරීක්ෂණ සහ සියලුම විමර්ශන පැවැත්වීමට ඉහත කී කොමසාරිස්වරුන් වන ඔබහට මෙයින් බලය හා අධිකාරිය පවරන අතර ම, මෙම බලය ලබාදීමෙන් මාස හයක් (06) ඇතුළත ඔබගේ පරීක්ෂණ සහ විමර්ශනවල සොයාගැනීම් සහ ඊට අදාළ ඔබගේ නිර්දේශ ඇතුළත් වාර්තාවක් මා වෙත ඉදිරිපත් කරන මෙන් ඔබතුමන්ලාට මෙයින් නියම කරමි.

තවද, ඔබගේ විමර්ශනයන්හි හෝ පරීක්ෂණයන්හි කාර්යයන් සඳහා ඔබ විසින් සහාය හෝ තොරතුරු ඉල්ලා සිටිය හැකි සියලුම රජයේ නිලධරයන් සහ වෙනත් තැනැත්තන් විසින් නිසි පරිදි දෙනු ලැබිය හැකි සියලුම සහාය දිය යුතු යැයි ද, සපයනු ලැබිය හැකි සියලුම තොරතුරු සැපයිය යුතු යැයි ද මෙයින් නියමකොට විධාන කරමි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ වර්ෂ දෙදහස් විසිතුනක් වූ ඔක්තෝබර් මස පහළොස්වන දින කොළඹ දී දෙන ලදී.

ගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ඊ. එම්. එස්. බී. ඒකනායක,
ජනාධිපති ලේකම්.

EOG 10-0177

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.